# අලෙක්සේයි තොල්ස්තෝයි

## රුසියානු චරිතය

රුසියානු චරිතය! කුඩා කෙටි කතාවකට මෙවැනි තේමාවක් වුවමනාවට වඩා බහු වැදගත්කමක් ගෙන දෙයි. එසේවතුදු, මම කුමක් කරම්ද, සැබැවින්ම මගේ අභිලාෂය වී ඇත්තේ ඔබත් සමග රුසියන් චරිතය ගැන කතා කිරීමය.

රුසියන් චරිතය. හැකි නම් එ ගැන විස්තර කරන්න. රුසියන් චරිතයේ වීර වික්‍රමාන්විත ක්‍රියා අරබයා විස්තර කරන්ටද? මේවා කෙතරම්දයත්, විස්තර කළ යුතු ලක්ෂණ කුමක්ද යන්න පිළිබඳව කෙනෙකුට ස්ථිර නිගමනයක් කළ නොහැකිය. මගේ මිතුරෙක් පෞද්ගලික ජීවිතයෙන් බිඳක් කී නිසා එය මට පිටිවහලක් විය. ඔහු සෝවියට් සංගමයේ වීරයා නැමැති රන් තරුව සහ තවත් උසස් පදක්කම් විශාල සංඛ්‍යාවක් පැළඳ සිටියත්, ඔහු ජර්මනුන්ට බැට දුන් සැටි මෙහි ලා විස්තර කිරීමට මම අකැමැති වෙමි. හේ චාම්ය, නිහඬය, සාමාන්‍යය. සරාතොව් ප්‍රදේශයේ වොල්ගා නදී බඩ ගමෙක සමූහ ගොවියෙකි, ඔහු. මේ පුද්ගලයාගේ වෙනත් ගති ගුණ අතර ශක්තිමත් චරිතයත් ඉතා යහතින් සංගතික ලෙස වැඩුණු කඩවසම් ගතියත් කැපී පෙනෙයි. යුද්ධයේ දෙවියකු වැනි ඔහු යුද්ධ ටැන්කියෙන් පිටතට එන විට, ඔහු දෙස බැලීම සිත් ගන්නා සුලු දෙයකි. ඔහු යුද්ධ ටැන්කියෙන්



පිටතට පනී. ඩහදියෙන් තෙත් වී ඇති මුදු මෙන් කැරලි හිසකේ මුදා ලමින් සම් මුවා හිස්වැස්ම ගළවයි. තෙල්, කුණු තැවරී ඇති මුහුණ පිසදා ගනිමින්, අධ්‍යාත්මික ප්‍රියංකර බවෙන් යුතුව මඳ සිනා පායි.

යුද්ධයේදී නිතරම මරණයේ ගැට්ට අසලට වී යුද්ධ කරන විටැ, ඔවුන්ගේ දුර්ගුණ සියල්ල ඉවත් වී, සූර්ය තාපය නිසා උඩුහම ගැළවී නිරෝගී වන සමක් සේ, ඔවුහු වඩාත් යහපත් මිනිසුන් බවට පත් වෙති. එවිට මිනිසුන්ගෙන් ශේෂ වනුයේ න්‍යෂ්ටිය පමණකි. එකකුගේ න්‍යෂ්ටිය ශක්තිමත්ය, තවත් එකකුගේ එය දුර්වලය, එහෙත් දුර්වල අයද වෙහෙස දරා වඩාත් යහපත් සහ අවංක සගයින් වීමට උත්සාහ කරති. මගේ මිතුරා යෙගෝර් ද්‍ර්යෝමව් යුද්ධයට පෙර සිටම දැඩි පිළිවෙතක් ඇති කෙනෙකු වූ අතර ඔහුගේ මවු – මාරියා පොලිකාර්පොව්නාටද, ඔහුගේ පියා – යෙගෝර් යෙගෝරොවිච්ටද ආදරය සහ ගෞරවය කළේය. හේ වරක් මෙසේ පැවසීය: ''මගේ පියා පැසුණු බුද්ධිය ඇති වැඩි මහල්ලෙකි. ප්‍රථමයෙන්ම ඔහුට ස්වයං ගරුත්වයක් ඇත. පුතා, ලෝකයේ බොහෝ දේ දකී වි, පිටරටත් යාවි. එනමුදු රුසියානුවකු වීම නිසා ආඩම්බර වෙන්න...''

ඔහු විවාහ ගිවිස ගෙනැ සිටියේද වොල්ගා නදී බඩ එම ගමෙහිම තරුණියක සමගය. යුද පෙරමුණේ ඇවිල පවතින සටන්වල නිහඬතාවයක් තිබේ නම්, විඳ දරාගත නොහැකි දැඩි ශීතත් පවතී නම්, යුද පෙරමුණු බිම් ගෙයි, කුප්පි ලාම්පු ගිනි සිළුව නටන විටත්, උණුසුම ගෙන දෙන කුඩා ගිනි උදුනේ දර කෝටු 'පට පට' ගා පුපුරණ විටත්, සෙබළුන් රාත්‍රි ආහාරයෙන් සප්පායම් වී සිටින විටත්, මනාලියන් ගැනත්, බිරියන් ගැනත් බොහෝ දේ කතා කරති. දෙකන් වලැ ඝෝෂාවක් ඇති වන තුරු මේ ගැන කතාබහ කෙරේ. නිදසුනක් වශයෙන් මෙසේ ආරම්භ වේ: ''ආලය යනු කුමක්ද?'' එකෙක්

මෙසේ පිළිතුරු දෙයි: ''ආලය පටන් ගන්නේ ගෞරවය පදනම් කැරගෙනයි.'' අනිකා හරස් වෙයි: ''මොන බොරුද, ආලය කියන්නේ පුරුද්දට, ඇබ්බැහි වීමට. මිනිහෙක් ආදරය කරන්නේ එයාගෙ ගැනිට විතරක් නොවෙයි, තාත්තට, අම්මට සතුන්ට පවා...'' –''මහ මෝඩ අදහසක්'' තෙවැන්නා කට දමයි, ''ආලය කියන්නේ තමාගේ මුළු සරුවාංගයම කිපී උතුරා නටන විට, හරියට වෙරි මත් වුණා වගෙ දෙයක්...'' මෙලෙස පටන් ගන්නා අදහස් දක්වීම් දාර්ශනික මට්ටමකින් පැයක් හෝ දෙකක් හෝ පවතින්නේ ජොෂ්‍ය සෙබළා ගාම්භීර ලෙස ඒ ප්‍රශ්නය ගැන අර්ථ නිරූපනයක් කරන තුරුය. යෙගෝර් ද්‍ර්යෝමව් මෙවන් කතාවලට මැදිහත් වීමට ලජ්ජාවූයෙන්, තම මනාලිය ගැන යම්තමින් පමණක් සඳහන් කළේය. ඒ කෙල්ල බොහොම හොඳ එකියක්. පොරොන්දු වුනා නම් කී ලෙසින්ම බලාපොරොත්තු වී ඉඳීවි. එක කකුලකින් ආපසු ආවත් බලාපොරොත්තුවෙන් හිටීවි...''

යුද්ධ වික්‍රමයන් ගැන කීමට නම් කොහෙත්ම කැමති නොවීය. ''අපොයි, ඒවා ගැන මතක් කිරීමට මා කැමති නැහැ!'' බැම රැළි නංවා ගෙන ඔහු දුමක් අදියි. ඔහුගේ යුද්ධ ටැන්කිය කළ සංග්‍රාමීය වික්‍රමයන් ගැන අප දැනගත්තේ ඔහුගේ සගයින්ගෙනි. විශේෂයෙන්ම අසන්නන් මවිතයට පත් කළේ යුද්ධ ටැන්කිය පදවන්නා වූ චුවිල්යෝව්ය.

''...තේරුණද, අපි යුද්ධ ටැන්කිය හැරෙව්වා විතරයි, කඳු ගැටියෙ ඉඳල එන්නේ නැතැයි... මම කැගැහැව්වා: ''ලයිතන් සහෝදරයා, ටයිගරයා!*'' ඔහු අණ කළා: ''ඉදිරියට පදවනු, වේගය වැඩි කරනු!'' මම වමටයි,

---

* ජර්මන් යුද්ධ හමුදාවේ **ටයිගර්** නැමති යුද්ධ ටැන්කිය.– අනුවාදක



දකුණටයි පදව, පදවා නත්තල් ගස් අසලින් මුවාවෙමින් අපේ යුද්ධ ටැන්කිය ගෙනිච්චා... ටයිගරයා පොට්ටයකු වගෙ අණක්-ගුණක් නැතුව ඔහේ වෙඩි තියාපි. වෙඩි පාරවල් ළඟින් යනවා... අපේ ලයිතන් ටයිගරයාගේ පැත්තකට ඇරියා පළමුවැනි පහර, දෙවැනි එක උගේ කුඩුම්බියට. ටයිගරයාගේ තුවක්කු හොඬ බිම වැටුණා වගෙ පහත් වෙච්චි... තුන්වෙනි පහරට ටයිගරයා දුම් දමාගෙන ගිනි ගත්තා නොවැ. ඒ ටයිගර් යුද්ධ ටැන්කිය පිපිරුවා විතරයි, ගිනි ජාලා මීටර් සීයක් විතර ඉහළ නැංගා... ජර්මන් කාරයො හදිසි දොරෙන් එළියට පැනපු හැටිය, වාන්කා ලෙප්ෂින් උන්ට මැෂින් තුවක්කුවකින් සංග්‍රහයක් කළා. ජර්මන් බටයො බිම දිග වෙලා පණ අදිනවා... ඔන්න ඉතින් අපට පාර නිදහස් වුණා. විනාඩි පහකින් අපි ගමකට ආවා. ඔන්න එහෙදි තමා මම බඩ පැලෙන තුරු හිනාවුණේ... පැසිස්ට් ජර්මන්නු හැරිච්ච, හැරිච්ච පැත්තට දුවනවා. කුණු ගොඩේ, මඩ ගොඩේ. සපත්තු නැතුව දුවනවා. මේස් විතරක් ඇඳ ගෙන දුවනවා. උන් ඔක්කොමල්ලා දිව්වේ පාළු මඩුවට. ඔන්න එතකොට ලයිතන් සහෝදරයා අණ කළා: ''මඩුවට යුද්ධ ටැන්කිය හරවනු!'' අපේ තුවක්කුව හරවලා මුළු වේගයම යොදවා අපේ යුද්ධ ටැන්කිය මඩුවට ඇරියා... කිරි අප්පේ! අපේ යුද්ධ ටැන්කිය උඩට පරාල, බාල්ක වැටිච්චි. ගඩොලුයි, ලැලියි, වහලෙ යටට වෙලා හිටිය පැසිස්ට් ජර්මන් කාරයොයි අඩි බිඩි ගාලා බිම වැටිච්චි. උන්ගේ ඇඟට උඩින් මම යුද්ධ ටැන්කිය පැදෙව්වා ඉතිරි එවුන් නැගිටලා ඇත් උස්සලා යටත් වුනා. 'හිට්ලර් කපෝතියි'...''

යෙගෝර් ද්‍ර්යෝමව් අවාසනාවට මූණ පාන තුරු සටන් කළේ එලෙසිනි. කුර්ස්ක් මහා සංග්‍රාමයේදී ජර්මන් හමුදාවල අන්තිම ලේ බින්දුව පවා ගලා යද්දී, තිරිඟු කුඹුරක කුඩා කඳු ගැටයක් මත තිබූ ඔහුගේ යුද්ධ ටැන්කිය ජර්මන් වෙඩි පහරකට ගොදුරු විය. යුද්ධ ටැන්කිය

තුළ සිටි සෙබළ පිරිසෙන් දෙදෙනෙක් එම පහරින් මිය ගියහ. දෙවැනි සතුරු වෙඩි පහරින් යුද්ධ ටැන්කියට ගිනි ඇවිලිණි. ඉදිරි දොරින් පිටතට පැනගත් යුද්ධ ටැන්කි රියැදුරු චුවිල්යෝව් ටැන්කිය තුළට රිංගා, සිහිසන් නැතිව සිටි ලයිතන් ද්‍ර්යෝමව්ව පිටතට ඇද ගැනීමට සමත් විය. ඔහුගේ යුද්ධ ඇඳුම ගිනි ගෙන ඇවිලෙමින් තිබිණි. චුවිල්යෝව් ලයිතන් තැනත් ඇදගෙන ඈතට ගියවිටම, යුද්ධ ටැන්කිය කොතරම් වේගයෙන් පිපිරුණේදයත්, එහි කුළුණ මීටර පණහක් පමණ ඉහළට වීසි විය. ගිනි ගෙන ඇවිලෙමින් තිබුණු ලයිතන්ගේ මුහුණටත්, හිසටත්, ඇඳුමටත් පස් අහුරු, අහුරු ගෙන චුවිල්යෝව් ඉසින්නට වූයේ ගින්න නිවා දැමීමටය. අනතුරුව ඔහු ලයිතන්ගේ සිරුරත් ඇද ගෙන යුද්ධ භූමියේ වළෙන් වළට බඩ ගාන්නට විය. ''මොකද දන්නවද මම එයාව ඇදගෙන ගියේ?'' – චුවිල්යෝව් කියන්නට විය, – ''මට ඇහුණා එයාගෙ හෘද වස්තුව වැඩ කරන හැටි...''

යෙගෝර් ද්‍ර්යෝමව් නොමළා පමණක් නොව, ඔහුගේ ඇස් පෙනීම පවා නැති නොවීය. එසේවුවද, ඔහුගේ මුහුණේ මස් ගින්නට දැවී අඟුරු බවට පත්වී, තැනින් තැන කටු පවා මතුවී පෙනිණි. ඔහුට යුද්ධ රෝහලක මාස අටක් තිස්සේ ප්‍රතිකාර ගැනීමට සිදුවිය. මුහුණ යථා තත්ත්වයට ගෙන ඒම පිණිස සුවිකාර්ය ශල්‍ය කර්ම එක පිට එක කරන්නට විය. නහය, දෙතොල්, ඇස් බැම, කන් ආදිය යළිත් 'පුනරුත්ථපානය කරන ලදී.' අට මසක ශල්‍ය කර්ම සහ ප්‍රතිකාර වලින් ඉක්බිතිව වෙළුම් පටි ලිහා දැමූ විට, ඔහු පෙර තිබුණු මුහුණ නොවන, දැන් තිබෙන මුහුණ දෙස බැලීය. ඔහුට මූණ බලන කුඩා කණ්ණාඩියක් දුන් හෙදිය, පිටුපා දුකින් කඳුළු සැළුවාය. ඔහු සැනෙකින් ඇයට එම කණ්ණාඩිය ආපසු දෙමින් මෙසේ පැවසීය:

''මෙයිට වැඩිය දේ සිදු වෙනවා. මේ වගේ මූණක් ඇතිව ජීවත් වෙන්ට පුළුවනි.''



එහෙත් එදා සිට ඔහු හෙදියගෙන් කණ්ණාඩියක් නොඉල්ලූ නමුදු නිතර මූණ අත ගාන්නට විය. ඔහු සැබවින්ම එම මුහුණට පුරුදු වුණාක් මෙනි. යුද්ධ කටයුතු භාර කමිසුම, ඔහු යුද්ධ පෙරමුණ ගෙන සටන් කිරීමට නුසුදුසු බව තීරණය කළේය. එවිට ඔහු යුද සෙනවි තැන වෙත ගොස් මෙසේ ඉල්ලා සිටියේය. ''යළිත් බලකායට යාමට ඔබේ අවසරය පතමි.'' – ''එහෙත් ඔබ රෝගාතුරයෙක්'' සෙනවි තෙමේ පැවසීය. ''රෝගියකු නොවෙමි. මා විරූපී මිනිහෙකි. යුද්ධ කිරීමට එය බාධාවක් නොවේ. යුද්ධ කිරීමේ හැකියාව මට සම්පූර්ණයෙන්ම ලැබී ඇත.'' හේ කියා සිටියේය. (ඔහු සමග කළ සාකච්ඡාවේදී සෙනවි තැන ඔහුගේ මුහුණ නොබැලීමට උත්සාහ ගත් සැටි දුටු ද්‍ර්යෝමව් සිදුරක් බඳු හැඩ රහිත දම් පැහැති දෙතොල් වලින් උපහාසාත්මක ලෙස සිනා සුණේය). ඔහුට පූර්ණ සුවය සඳහා දින විස්සක නිවාඩුවක් ලැබුණු අතර ඔහු දෙමාපියන් දැක බලා ගැනීමට ගෙදර බලා ගියේය. එය එම වසරේ මාර්තු මාසය විය.

දුම්රිය පොළේ සිට ඔහු ගැලක් ගැනීමට බලාපොරොත්තු වූ නමුදු, හැතැප්ම 14 ක් පමණ වූ එම දුර ඔහු පයින්ම ගියේය. වටපිටාව සුදෝසුදු හිමෙන් වැසිලාය. තෙතමනය සහ පාළු ගතියක්ද දැනිණි. ඉතා දැඩි හුළං පහර නිසා ඔහුගේ සෙබළ කබායේ වාටිය වැනෙන්නට විය. ඒකතානමය පාළුවක් ඇති කැරැමින් සුළං පහර හඬ නංවාලීය. ඇදිරි වැටෙත්ම, ඔහු තම ගමට පැමිණියේය. ළිඳට සහ එයට සවිකළ කොකෙකුගේ දිග බෙල්ලක් බඳු ආඩියා 'කර-කර' හඬක් නැගීය. එතැන් සිට හයවැනි ගෙය දෙමාපියන්ගේය. ඔහු ඇත් සාක්කුවල ඔබාගෙන හිටි හැටියේම නැවතුණේය, හිස වැනීය. හැරී නිවෙස බලා පා නැගීය. දණක් පුරා හිම ගොඩෙහි එරී, කවුළුව අසලට විත්, කඳ නමා බැලූ විට ඔහුට අම්මා දැක ගත

හැකි විය. මේසය මත තිබෙන ලාම්පුවෙක කනමැදිරි එළියේ ආධාරයෙන් අම්මා රාත්‍රි ආහාරය ගැනීමට සූදානම් වෙමින් සිටියාය. කළු පැහැති ලෝගුවක් වැනි ගවොමක් ඇඟ ලා සිටි ඕ සන්සුන්ය, කලබල රහිතය, දයාන්විතය. ඇ මහලු වෙලාය, ඇගේ කෙට්ටු දෙවුර ඉදිරියට නෙරා තිබිණි... ''අනේ මම දැන සිටියා නම්, දිනපතාම වචන දෙකක්වත් ලිවිය යුතුව තිබුණා...'' මේසය මත තිබුණේ ඉතා චාම් ආහාරය. කිරි කෝප්පයක්, පාන් කැල්ලක් හැඳි දෙකක්, දිය ලුණු ස්වල්පයක් පමණකි. ඇ මේසය අසල සිටගෙනැ ඇගේ කෙට්ටු දැත් බැඳගෙනැ කල්පනාවෙහි නිමග්නවැ සිටී... යෙගෝර් ද්‍ර්යෝමව් කවුළුවට පිටතින් අම්මා දෙස බලන්නේ ඇය බියගැන්වීම නොකළ යුතු දෙයක් බවත්, ඇගේ මහලු මුහුණ දුක නිසා තිගැස්සීමට ඉඩ නොහැරිය යුතු බවත් ඉටා ගත්තේය.

''හා, හොඳයි!'' යනුවෙන් ඔහු තමාටම කියා ගෙන, ගෙවැටෙහි කඩුල්ල හැර, ගෙවත්ත හරහා දොර අසලට ගොස් තට්ටු කළේය. ගෙතුළ සිටි අම්මා ප්‍රශ්න කළාය: ''ඔතන කවුද?''–''සෝවියට් සංගමයේ වීරයකු වන ලයිතන් ග්‍රෝමව්,'' ඔහු පිළිතුරු දුන්නේය.

ඔහුගේ හදවතට දැනුණේ තියුණු වේදනාවෙකි. ඔහු ගෙදොරෙහි හරස් පොල්ලට හේත්තු විය. නැත, අම්මා පුතාගේ කට හඬ හඳුනා නොගත්තාය. ඔහුටද බොහෝ ශල්‍ය කර්මවලට පසුව ඔහුගේ කට හඬ වෙනස් වී ඇති නිසා එය ප්‍රථම වරට ඇසුවාක් මෙන් විය. එම කට හඬ බැරෑඩිය, බොල්ය, අපහැදිලිය.

''උන්නැහේ තමුසෙට ඕන මොනවද?'' ඕ ප්‍රශ්න කළාය.

''මාරියා පොලිකාර්පව්නාට ඇගේ පුතා වන ජොෂ්ය ලයිතන් ද්‍ර්යෝමව්ගෙන් මම සුබ පැතුම් ගෙනාවා.''

එවිට ඇ දොර හැර ඔහුට ආචාර කොටැ ඔහුගේ දැත් අල්ලා ගත්තාය.



''ජීවතුන් අතරද මගේ යෙගෝර්, ඔහු සනීපයෙන්ද? මේ උන්නැහේ ගෙට ඇතුළු වෙන්න.''

යෙගෝර් ද්‍ර්යෝමව් මේසය අසල වූ බංකුව මත වාඩි විය. ඔහු බංකුවේ වාඩි වූ විට, ඔහුගේ පාද මහ පොළවට නොවැදන තරම් කුඩා කාලයේදී ඔහු වාඩිවූ තැනමය දැනුත් වාඩිවී ඉන්නේ. ඒ කාලයේදී අම්මා ඔහුගේ මුදු කෙස් කැරලි අත ගාමින් ''මගේ හොඳ පුතේ කන්න!'' යැයි කී සැටි ඔහුට මතක් විය. ඔහු ඇගේ පුතා හෙවත් තමා ගැන විස්තර කැරැමින් ඔහු කන බොන සැටිත්, අඟ හිඟයක් නැතිව, සනීපයෙන් සතුටින් ජීවත් වන සැටිත් ඇයට කියුවේය. ඔහු ඔහුගේ යුද්ධ ටැන්කියත් සමග යුද්ධ කළ සැටිද කෙටියෙන් විස්තර කළේය.

''ඔහේ කියන්නෙ යුද්ධ කිරීම බොහොම බයානකද?'' ඇ ප්‍රශ්න කළේ ඔහුගේ මුහුණ තම ඇඳිරි, නොපෙනෙන දෙනෙත් වලින් බලමින් සහ ඔහුගේ විස්තරයට බාධා කැරැමිනි.

''ඔවු, සත්තකින්ම, බයානකයි, අම්මේ. ඒ වුණත් පුරුදු වෙනවා.''

ඔහුගේ පියා යෙගෝර් යෙගෝරොවිච් පැමිණියේය. මෑත කලෙක සිට ඔහු මහලු බවට පත්වී ඇත. ඔහුගේ යටි රැවුලට පිටි මුසු කළ විටෙක මෙන් එය තැනින් තැන, කඩින් කඩ පැසිලාය. අමුත්තා දෙස බැලූ ඔහු දොරකඩ අසල පරණ හිම සපත්තු හප්පා, හිම ශුද්ධ කොටැ, කලබල නොවී, ගෙළ වටා ඔතා තිබුණු මප්ලරය ලිහා, හිම කබාය උනා, මේසය ළඟට විත් අමුත්තාට අතට අත දී ආචාර කළේය. අහෝ, ඔහුට ඒ අත සුපුරුදුය, පුළුල්ය, පියාගේ සාධාරණ හස්තය ය! ඔහු කිසිදු ප්‍රශ්නයක් නැගුවේ නැත. යුද පදක්කම් පැළඳි අමුත්තකුගේ පැමිණීම ප්‍රශ්න නැතුව වුව වටහා ගත හැකි බැවිනි. ඔහුත් වාඩි වී, දෙනෙත් අඩවන් කැරැගෙන කතාවට සවන් දෙන්ට විය.

වෙස් වලහාගෙන ලයිතන් ද්‍ර්යෝමව් තමා ගැන ඇති තතු වෙනත් අයකුගේ ලෙස විස්තර කැරුත්ම, සත්‍යය හෙළිකිරීමට ඇති ඉඩකඩ වඩාත් ඇහිරිණි. අම්මේ, තාත්තේ! මා විරූපීව, සිටියද මා ඔබේ පුතා, ඔබ එය පිළිගන්නැයි කීමට ඔහුට කොහෙත්ම නොහැකි විය... දෙමාපියන්ගේ කෑම මේසය අසල වාඩි වී සිටින ඔහුට ප්‍රියමනාප එමෙන්ම අමනාප ගතියක්ද දැනෙන්ට විය.

''එහෙනම් ඉතින් අපි මොනවා හරි කමු! අපේ අමුත්තාට මොනවා හරි සොයා දිය යුතුයි, අම්මේ'' යැයි කී යෙගෝර් යෙගෝරොවිච් මාලු අල්ලන බිලී කටු සහිත ගිනි පෙට්ටියක් වම් මුල්ලේ තබා ඇති පරණ කුඩා අල්මාරියේ දොර හැරියේය. එම ගිනිපෙට්ටියත්, අඬුව බිඳුණු තේ පොච්චියත් තවමත් එතැනම තබා ඇත. එයින් පාන් කුඩු සහ ඇනූ පොතු මිශ්‍ර සුවඳක් වහනය විය. යෙගෝර් යෙගෝරොවිච් අල්මාරියෙන් වයින් බෝතලයක් එළියට ගෙනැ සුසුමක් හෙළුවේ, එහි කුඩා වීදුරු දෙකකට පමණක් සෑහෙන්ට වයින් තිබුණු බැවිනි. ඉස්සර කාලේදී මෙන්ම රාත්‍රී ආහාරය ගැනීමට වාඩිවූහ. හැන්ද ගත් තම අත දෙස මවුතුමිය ඉමහත් ඕනෑකමකින් බලන සැටි ආහාර ගනිමින් සිටි ලයිතන්ගේ නෙතට හසුවිය. ඔහු මඳ සිනාවක් පෑ විට, ඕ දෙනෙත් ඔසවා බැලුවාය. ඇගේ මුහුණ වේදනාත්මක ලෙස ගැස්සී නැටවිණි.

ඔවුහු නොයෙක් දේ ගැන සාකච්ඡා කළහ. මේ වර වසන්තය කොහොමට හිටී විද, ගොවිතැන් වැඩ වලදී ජනතාවට සාර්ථකත්වයක් ලබාගත හැකිද, මේ වසරේ ගිම්හානයේදී යුද්ධයේ අවසානය බලාපොරොත්තු විය යුතු යැයිද, ආදිය ඔවුන්ගේ කතාවට ලක්විය.

''යෙගෝර් යෙගෝරොවිච් ඔබ මේ ගිම්හානයේදී යුද්ධය අවසන් විය යුතු යැයි කල්පනා කරන්නේ කුමක් නිසාද?''

''මහජනතාව කෝපයට පත්වෙලා. ඔවුන් මරණය



පහු කරගෙන ගියා. දැන් ඉතින් නවත්වන්ට බැහැ. ජර්මානුවා කපෝතියි!'' යෙගෝර් යෙගෝරොවිච් පිළිතුරු දුන්නේය.

මාරියා පොලිකාර්පොව්නා මෙසේ ඇසුවාය:

''මගේ පුතාට නිවාඩු ලැබෙන්නේ කවදාටද, එයා ගෙදර එන්නේ කවදාටද කියලා ඔහේ කියුවේ නැහැ නොවැ. අවුරුදු තුනක් වෙනව එයාව නොදැක. දැන් එයා ලොකු මිනිහෙක් වෙලා ඇති, උඩු රැවුළක් එහෙම වවලා ඇති. ඉතින් හැමදාම එයා මරණය ළඟම නොවැ. එයාගෙ කටහඬත් රළු වෙලා ඇති නේද?''

''ඔවු. එයා ගෙදර ඒවි, ඔහෙලාට එයාව හඳුනාගන්නවත් බැරුව යාවි'' ලයිතන් තැන පැවසීය.

උඳුන උඩ විශාල මැස්ස මත ඔහුට නිදා ගැනීමට ඉඩ සලස්වන ලදී. ඔහු මේ මැස්සෙහි හැම ගඩොල් කැටයක්මත්, ගස් කඳන් වලින් සාදන ලද බිත්තියෙහි ඇති සෑම සිදුරක්මත්, සීලිමේ ඇති සෑම රිකිල්ලක සළකුණක්මත් ඔහු දනී. මෙහි බැටළු ලොම් වල සුවඳක් සහ පාන් සුවඳක් වහනය වෙයි. තමාටම විශේෂවූ මෙවන් සැප පහසුවක් මරණ මොහොත දක්වා ඔහුට අමතක නොවේ. අඳුරන ලද එහා කාමරයෙහි තාත්තා ගොරවමින් නිදයි. අම්මා ඒ-මේ අත පෙරළෙමින්, සුසුම් ලමින් නොනිදා සිටියාය. ලයිතන් දෑතේ අත්ල මත මුහුණ තබාගෙන මුණින් අතට වැතිරගෙන කල්පනා කරන්නට විය: ''ඇත්තටම මාව අඳුනා ගන්ට බැරිවුණාද? ඇත්තටම අඳුනා ගන්ට නොහැකි වුණාද? අම්මේ, අම්මේ...''

උදෑසන ඔහු අවදිවුණේ ගිනි උදුණේ දරකෝටු පිපිරෙන හඬ විසිනි. අම්මා ඉතා ප්‍රවේසමින් ලිප ළඟ කටයුතු වල යෙදුණාය. බූට්ස් සපත්තු අඳින විට කකුලට ඔතන ''පර්ත්යාන්කි'' සෝදා වැලෙහි වනා තිබිණි. ඔහුගේ සෙබළ බූට්ස් ජෝඩුව පිසදා පවිත්‍ර කැරලාය. ඒවා දොර අසල තබා ඇත.

"තිරිඟු පිටිවලින් හදාපු රොටී කනවද?" ඕ ඇසුවාය.

ඔහු එකවර පිළිතුරු නොදුන්නේය. මැස්සෙන් බිමට බැස සෙබළ කමිසය ඇඳගෙනැ, බඳ පටිය බැඳ ගෙනැ, පාවහන් නැතිව බංකුව මත වාඩිවිය.

"ඔහේලගේ ගමේ කාත්යා මලීෂෙවා, අන්ද්‍රෙයි ස්තෙපානොවිච් මලීෂෙව්ගේ දුව ඉන්නවද?"

"ඔවු. එයා පහුගිය අවුරුද්දේ ගුරු පාඨ මාලාවක් පාස් කරලා දැන් උගන්වනවා. නුඹට ඇයව හමුවෙන්ට ඕනද?"

"ඔහේලගේ පුතා කිව්වා ඇයට සුබ පැතුම් පිරිනමන්ටයි කියලා."

අම්මා තරුණිය කැඳවා ගෙන එනු පිණිස අසල් වැසි ගෙදර කෙල්ලක් පිටත් කළාය. ලයිතන් බූට්ස් දෙක පයලා ගැනීමටත් පෙර කාත්‍යා මලීෂෙවා පැමිණියාය. ඇගේ විශාල නුවන් අළු පැහැතිය, ඒවා දීප්තිමත්ය. ඇගේ දෙබැම විමතිය නිසා ඉස්සී තිබිණි. දෙකොපුල්වලැ ප්‍රීතිමත් රෝස පැහැයකි. ඇ තම හිස බැඳ තිබුණු ගෙත්තම් ලේන්සුව පුළුල් උරහිසට වැටෙන සේ මුදා හරිත්ම, ලයිතන් තැන සුසුම් ලමින් තමාටම මෙසේ කියා ගත්තේය: ඒ උණුසුම් පැහැපත් හිසකේ සිප ගැනීමට ඇත්නම්!.. ඒ පෙම්බර මිතුරිය ඔහුගේ සිත ඇඳුණේ එපරිද්දෙනි – ප්‍රණීත, මෘදු, ප්‍රීතිමත්, දයාන්විත, සුන්දර ලෙසිනි. ඇ ගෙට ඇතුළු වනවාත් සමග ගෙට අමුතු ආලෝකයක් ලැබිණි.

"ඔබ යෙගෝර්ගෙන් සුබපැතුම් ගෙනාවාද? (හේ එළියට පිටුපා සිටගත්තේය. ඔහු එසේය යන්න අඟවමින් හිස වැනුවේ, කතා කිරීමට අසමත් වූ බැවිනි.) මම එයා එන තුරු රෑ දවල් නොතකා බලා ඉන්නවයි කියලා එයාට කියන්න..."

ඕ ඔහුට ළං වූවාය. ඔහු දෙස ඕනෑකමින් බැලූ ඇ, ඇගේ ළයට සැහැල්ලු පහරක් වැදුණු විටෙක මෙන්, ඇතට ගියේ බිය වෙමිනි. අදම ගෙයින් පිටවී යා යුතු යැයි ඔහු තීරණය කළේ එවිටය.

උණු කිරිත් සමග අම්මා තිරිඟු රොටී පිසුවාය. ඔහු



යළිත් ලයිතන් ද්‍ර්යෝමව් ගැන සිය විස්තර කථනය පටන් ගෙන, ඔහුගේ යුද්ධමය වික්‍රමයන් ගැන ඉතා දැඩි ලෙස කියන්නට වූයේ, කාත්‍යා දෙස නොබලමිනි. මන්දයත්, ඇගේ අලංකාර නුවන්වලින් ඔහුගේ විරූපී මුහුණේ ප්‍රතිබිම්බය නොදකිනු පිණිසය. සමූහ ගොවිපොළේ අශ්වයා ලබාගනු වස්, යෙගෝර් යෙගෝරොවිච් මහන්සි වුණද, ලයිතන් තැන පැමිණි පරිදිම පා ගමනින් ආපසු ගියේය. සිදුවුණු දේ නිසා ඔහු ඉමහත් පසුතැවිල්ලට පත් විය. ඔහු ගමන නතර කොටැ අත්ලෙන් මුහුණට ගසා ගනිමින් බැරෑඩි හඬෙකින් මුමුණන්නට විය: "දැන් ඉතින් ජීවත් වන්නේ කෙසේද?"

සෙබළුන් බඳවා ගැනීම සඳහා යුද පෙරමුණෙහි පසුපස නැවතී සිටි තම බලකායට ඔහු ආවේය. සංග්‍රාම ශූර ඔහුගේ සගයෝ ඔහු කොතරම් සාදරයෙන් පිළිගත්තෝදයත්, ඔහුට නිදාගැනීමට, ආහාර ගැනීමට සහ හුස්ම ගැනීමට පවා ඉඩ නොදුන් දුක අධ්‍යාත්මයෙන් තුරන් විය. අම්මා ඔහුගේ අවාසනාව පිළිබඳ සැබෑ තතු කලකට නොදැන සිටීම මැනවයි තීරණය විය. කාත්‍යා පිළිබඳ ප්‍රේමය නැමැති රෝස මල් කටුව ඔහුගේ හදවතින් ඔහු උදුරා දමනු ඇත.

සති දෙකක් ඉකුත් වත්ම, ඔහුට අම්මාගෙන් ලියුමක් ලැබිණි:

"මගෙ දයාබර පුතුනි; පුතාට ලියන්ට මා බයයි. මොනවා සිතාගැනීමට කියලාවත් දන්නේ නැහැ. පුතේ, නුඹේ සුබපැතුම් රැගෙන අපේ ගෙදරට කෙනෙක් ආවා. ඔහු ඉතා හොඳ කෙනෙක්. මුහුණ පමණක් විරූපී වෙලා. අපේ ගෙදර දවස් කීපයක් නවතින බව මුලදි කිව් නමුත්, පසුව එක පාරටම යන්ට ගියා. අනේ මගේ පුතේ එදා සිට රෑට මට නින්දක් නැහැ. මට හිතෙන්නේ මගේම පුතා වන නුඹ ආවායි කියලයි. යෙගෝර් යෙගෝරොවිච් මට බණින්ට පටන් අරගෙන – අනේ මහලු අම්මණ්ඩියේ

නුඹට එහෙම සිතෙන්නේ නුඹට ඔල්මාදෙ හැදිල තියෙන නිසා කියලා කියනවා. ආපු එක්කෙනා අපේ පුතා නම්, එයා එක පාරටම ඒ ගැන කියාවි නොවැ... අපේ පුතා නම් එයාට එය සහවන්ට තියෙන හේතුව කුමක්ද, අපේ ගෙදරට ආපු එක්කෙනාගේ මුහුණ වැනි මුහුණක් නිසා ආඩම්බර වෙන්ට ඕන!.. යෙගෝර් යෙගෝරොවිච් මාව සනසන්ට උත්සාහ කරනවා. නමුත් මගේ මාතෘ හෘදය වස්තුව මෙහෙම කියනවා: අපේ ගෙදරට ආවේ මගේ පුතාමයි!.. අපේ ගෙදරට ආපු එක්කෙනා ගිනි උදුනේ මැස්ස උඩ නිදා ගත්තා. මම එයාගේ සෙබළ කබාය පිහදාන්ට ගෙවත්තට ගෙනියලා එය බදා වැළඳගෙන ඇඬුවා. ‘‘ඇවිත් ඉන්නේ මගේ පුතා. මේ කබාය එයාගේ!..’’ අනේ මගේ ආදර පුතේ, ක්‍රිස්තු තුමාගේ නාමෙට මට ලියන්න. ඇත්ත ලියා එවන්න – මොනවා සිද්ද වුනාද? නැතිනම් මට හැබෑටම පිස්සු වැටේවි...’’

යෙගෝර් දර්යෝමව්, ඉවාන් සුදරෙව් වන මට එම ලියුම පෙන්වා, සිදුවූ දෙය විස්තර කරන්නේ, දෙනෙත් පිස දමාගත්තේය. මම ඔහුට මෙසේ පැවසීමි: ‘‘ඔන්න මුරණ්ඩු කමෙක හැටි! තකතීරුවා, නුඹ හැබෑම තකතීරුවෙක්. අම්මාට වහාම ලියපන්. ඇගෙන් සමාව ඉල්ලපන්. ඇයව පිස්සු වට්ටන්ට එපා... නුඹේ රූපාලංකාරය ඇයට කොහෙත්ම ඕන නැහැ මිනිහෝ! නුඹට ඇය තවත් වැඩියෙන් ආදරය කරාවි...’’

ඔහු එදිනම ඇයට ලියුමක් ලියුවේය: ‘‘ආදර මගේ දෙමාපියණි,– මාරියා පොලිකාර්පොව්නා සහ යෙගෝර් යෙගෝරොවිච්, මගේ මෝඩකම සහ අමනකම නිසා මට සමාවන්න. ගෙදර ආවේ මාය, ඔබගේ පුතාය...’’ මෙවැනි වාක්‍ය වලින් පිටු හතරක් පුරා ඔහු ඉතා කුඩා අකුරු වලින් ලියුවේය. පිටු විස්සක් වුනත් ඔහු ලියනු ඇත.

දවස් කීපයකට පසු අප ඔහුත් සමග යුද්ධාභ්‍යාස භූමියෙහි සිටින විට, සෙබළෙක් දුවැවිත් යෙගෝර් ද්‍ර්යෝමව් ඇමතීය: ‘‘කපිතන් සහෝදරයා, ඔබව හොයනවා...’’ ඒ සෙබළා නිසි පරිදි සීරුවෙන් සිටියද ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වනුයේ, ඔහු මත්පැන්බීමට සැරසුණු සැටියෙකි. අපි ද්‍ර්යෝමව් සමග එකට වාසය කළ කුඩා පැළ වෙත ගියෙමු. ඔහු කැළඹීමට පත්වැ නිතර කහින්නට විය... ‘‘යුද්ධ ටැන්කියක් මෙහෙයැවුවාට මිනිහා නහර දුර්වලත්වයෙන් පෙළෙනවා’’ යැයි මම සිතීමි. ඔහු මට ඉදිරියෙන් ගොස් ගෙපැළට ඇතුළු විය. එවිට මට මෙසේ ඇසිණි:

‘‘අම්මේ ආයුබෝවන්, ඒ මමයි!’’ කුඩා සිරුරකින් හෙබි මැහැල්ලක් ඔහුගේ පපුව බදාගත් සැටි පෙනිණි. වට පිට බලන විට, තවත් කාන්තාවක් එහි සිටින සැටි මම දුටිමි. මම ඔබට අවංකව කියන්නම්, රූසපුවෙන් හෙබි කතුන් තවත් සිටිනවා විය යුතුය, එසේවතුදු, පෞද්ගලිකව මා නම් මෙතරම් ලස්සන එකියක දැක නැත.

ඔහු අම්මාගෙන් ඇත්වී, ඒ රුවැත්තිය වෙත ගියේය. යෝධයකුගේ සිරුරක් ඇති මේ මිනිහා යුද්ධයේ දෙවියකු බව මට වැටහිණි. ‘‘කාත්‍ය’’ හේ ඇය ඇමතීය,– ‘‘කාත්‍යා, ඔබ මොකටද මෙහෙ ආවේ? ඔබ බලාපොරොත්තු වූ මිනිහා නොවෙයි දැන් ඉන්නේ...’’

කාත්‍යා නැමැති ඒ රුවැත්තිය මෙසේ පිළිවදන් දුන්නාය: ‘‘යෙගෝර්, මා ඔයත් එක්ක මගේ මුළු ජීවිත කාලයම ගෙවීමට ඉටාගෙන ඉවරයි. මා ඔයාට අවංකවම ආලය කරනවා. ඉතාමත්ම ආලය කරනවා... මාව අතහැර දමන්ට එපා...’’

මෙන්න රුසියානු චරිතයේ හැටි! බැලූ බැල්මට නම් මිනිසා චාම්ය. එහෙත් දුක් කරදර පැමිණි විට, කුඩා හෝ ලොකු හෝ වේවා, ඒවා මැඩ නැගී සිටීමට තරම් ඔහු තුළ ඇත්තේ අති මහත් උතුම් බලයෙකි – මානව දයාවේ සුන්දරත්වයෙකි.

*1942-1944*

# අන්තර්ජාල පුස්තකාලය

මාඕවාදී විප්ලවීය ලීගය
Maoist Revolutionary League (MRL)

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

කොමියුනිස්ට් දර්ශනය අධ්‍යයනය කිරීමට,
ලිපි සහ මූලාශ්‍ර බාගත කර ගැනීමට
වෙබ් අඩවියට පිවිසෙන්න...